# පිළිසඳර

2016
මාර්තු/අප්‍රේල්
pilisandara.npas@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of The National Photographic Art Society of Sri Lanka




## ඔබටත්, පවුලේ සැමටත් සුබ අලුත් අවුරුද්දක් වේවා!

## මහාබෝධි බිතුසිතුවම් ව්‍යාපෘතිය නිම කෙරේ.



මහාබෝධි විද්‍යාලයේ තාප්පයේ ‘උපදේශාත්මක චිත්‍රාවලිය නවීකරණය’ මාස 03කට අධික කාලයක් තිස්සේ ඉරිදා දිනවල සිදු කෙරුණු අතර ප්‍රවීණ චිත්‍ර කලා උපදේශක ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රියන්ත අබේසුන්දර මහතා ඊට මාර්ගෝපදේශකත්වය සැපයීය. එස්. ඩී. පියදාස මහතා ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සිදු කළ අතර, මහාබෝධි විද්‍යාලයේ විදුහල්පති උපුල් කාරියවසම් මහතාගේ සහ විදුහලේ ආරක්ෂක නිලධාරි ආර්. කේ. සමන් මහතාගේ පූර්ණ සහාය මේ සඳහා ලැබී තිබිණි. ෂම්මි ප්‍රියංක, රුසිරු තරංග පෙරේරා, ප්‍රසන්න විමලරත්න, එස්. පී. එච් ධනංජය, ප්‍රදීප් නිදර්ශන් ප්‍රනාන්දු, විරංග සංදීප පතිරගේ, එච්. කේ. දහනායක, හේමමාලි අල්විස්, ඩී. ඩබ්. ඩබ්. බණ්ඩාරවත්ත, චන්දික අජිත් ඇතුලු සාමාජික පිරිස මේ සඳහා තම නිර්මාණ දායකත්වය ලබා දුන්හ. ඒ සැමට සංගමයේ ප්‍රණාමය පිරිනැමේ.

## දේශීය ඡායාරූප සම්මාන අතරට වරලත් සාමාජික සම්මානය - *LNPAS*

ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ නිර්දේශයනට යටත් ව කුසලතා හා ඇගයීම් පාදක සාමාර්ථ්‍යයන් පදනම් කොටගෙන දැනට පිරිනැමෙන ඇසුරු සාමාජිකත්ව සම්මානය (ANPAS) හා සහාගී සාමාජිකත්ව සම්මානය (FNPAS) අතරට තවත් සම්මානයක් හඳුන්වා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට තිබේ. එය ඇසුරු සාමාජිකත්ව සම්මානයට පහළ මට්ටමක පවතින්නක් වන අතර වරලත් සාමාජිකත්ව සම්මානය (LNPAS) නමින් හඳුන්වා දෙනු ලැබ ඇත.

2016 නව චක්‍රලේඛ සංශෝධනයන්හි දී මෙය නීත්‍යානුකූල ව පිළිගනු ලබන අතර මෙම වසරේ පටන් අනිකුත් සම්මාන සේ ම LNPAS සම්මානය ද අයදුම් කළ හැකි ය. එසේ ම මෙය සංගමයේ මෙතෙක් සාමාජිකත්වය නොලත් විදේශිකයනට හා මෙරට අයට ද ඉල්ලුම් කළ හැක්කකි. වැඩි විස්තර හා විමසීම්, ගරු ලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න (071 4901200) වෙතිනි.

# වසන්ත චාරිකාවේ සඟෙද සිහිවටන




පසුගිය මාරතු 18 වැනි දින ආරම්භ කෙරුණු නුවරඑළිය චාරිකාව 20 වැනි දින පස්වරුවේ මහත් සාර්ථකත්වයකින් නිමා කරන්නට හැකි විය. ඡායාරූප පංතිවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්, ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ද ඇතුළු 126 දෙනෙක් මේ සඳහා සහභාගි වූහ.

චාරිකාව පුරාවට ම ප්‍රායෝගික ඡායාරූප උපදේශන කාර්යයන්ගෙන් ඊට මාර්ගෝපදේශනය සැපයූ ප්‍රවීණ හා ජ්‍යෙෂ්ඨ ඡායාරූප කලාවේදීන් වන බන්දු ගුණරත්න, ප්‍රියන්ත අබේසුන්දර, ඩී. කේ. ලැන්ට් යන මහත්වරුන් සහයෝගය කාගේත් පැසසුමට පාත්‍ර විය. 19 වැනි දින නුවරඑළිය *Green Hill* නිකේතනයේ දී පැවැත්වූ සුන්දර රාත්‍රිය වර්ණවත් කරන්නට ප්‍රථම, දෙවන හා තෙවන වසරවල විද්‍යාර්ථීහු කැපවීමෙන් කටයුතු කළහ. නාට්‍ය, විනෝදාත්මක රංගන, ගීතමය ඉදිරිපත් කිරීම් ඇතුළු අංග රැසක් එම වැඩසටහනට ඇතුළත් විය.

පැවැත්වූ විශේෂාංග වැඩසටහන් ඇගයීම වෙනුවෙන් ත්‍යාග පිරිනැමීමට දායකත්වය ලබා දුන් 'ෆොටෝ ටෙක්නිකා' ආයතනයටත්, ජ්‍යෙෂ්ඨ සාමාජික නීල් වීරසිංහ මහතාටත් විශේෂ ස්තූතිය හිමි වේ. එසේ ම මෙම වැඩසටහන සාර්ථකව සංවිධානය කළ සමාජසේවා සතු සුබසාධන අධ්‍යක්ෂ එස්. ආර්. ඒ. ආර්. සිංහබාහු මහතා සහ සම්පත් පීරිස්, ශ්‍යාමලී කරුණාපාල, නන්දනී හෙට්ටිආරච්චි, ඉන්දික ප්‍රනාන්දු, එස්. රම්දාස්, උපනන්ද සෙනෙවිරත්න, හේමමාලි අල්විස්, තිනේෂා එදිරිසිංහ, මනුජිත් කටුගම්පොල ඇතුළු ක්‍රියාකාරී සාමාජික භවතුන්ට සංගමයේ ගෞරවය පිරිනමමු.

---

## මනුෂ්‍යත්වයට දෑත් දිගු කරනා සුරේෂ්




අප සංගමය මගින් හුදු කැමරාකරුවන් නොව මානුෂීය ගුණාංගයන්ගෙන් පිරි ඡායාරූප ශිල්පීන් ලක්මවට දායාද කරන බව පසක් කරමින් අප සංගමයේ තෙවන වසර විද්‍යාර්ථියෙකු වන සුරේෂ් එස්. වීරසිංහ මහතාගේ දැඩි කැපවීම මත සුබසාධන ක්‍රියාවලියක් පසුගියදා සිදු කෙරිණි.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය වසමේ සාගරපුර නම් අති දුෂ්කර ගම්මානයේ සිඟිති පෙර පාසලේ විවිධප්‍රසංගයක් සුරේෂ් මහතා ඇතුලු ඔහුගේ මිතුරන් කිහිප දෙනෙකුගේ ශ්‍රම හා සම්පත් දායකත්වයෙන් ඉතා සාර්ථක ව සංවිධානය කරන ලදී. සිංහල පවුල් 12 ක් පමණ වසන සාගරපුර දුෂ්කර ගම්මානයේ කැලේ පිපෙන මල් වැනි කුඩා සිඟිත්තන්ට තම සැඟවුණු හැකියාවන් ඔප් නංවා ගැනීමට මෙම සත්කාරය මනා තෝතැන්නක් විය. අනතුරුව ඔවුනට හැකි පරිදි සිඟිත්තන්ට පාසල් උපකරණ හා ත්‍යාග පිරිනැමීම ද මෙහි දී සිදු කෙරිණි. මේ සඳහා ඔහුට මහත් රුකුලක් වීමට ජයන්ත විජේසිංහ මහතා ඇතුලු මිතුරු කැල ද සමත් විය. ප්‍රසංගයෙන් අනතුරුව සාගරපුර සිඟිති පෙර පාසල් ගොඩනැගිල්ල තීන්ත ආලේප කොට, අනතුරුව සිත්තම්වලින් අලංකාර කිරීම ද ඔවුනතින් සිදු කෙරිණි. මෙම සත්කාරය සාර්ථක ව නිමකිරීමට නාවික හමුදාවෙන් ද ඔවුනට නොමඳ සහයෝගයක් ලැබිණි.

මේ අතර සාගරපුර ගම්මානයේ ආරණ්‍ය සේනාසනයෙහි වැඩවෙසෙන උතුරු නැගෙනහිර හා තමන්කඩුව දිශාවේ ප්‍රධාන සංඝනායක අතිපූජ්‍ය පනාමුරේ තිලකවංශ හිමියන්ගේ ඉල්ලීම පරිදි එම වන සෙනසුනෙහි සිතුවම් ඇඳීම සඳහා ද සුරේෂ් මහතා ඇතුළු පිරිස තම කාලය ශ්‍රමය හා සම්පත් දායකත්වය නොමසුරුව ලබා දෙන ලදී.

වර්තමානයේ මුදල් පසුපස හඹා යන සමාජ රැල්ලට හසු නොවී මනුසත් බව වපුරන මෙවැනි විද්‍යාර්ථීන් අප සංගමය සතු වීම පිළිබඳව අපි ආඩම්බර වෙමු.

***මධුෂිකා ලක්මාලි***

# ඔබට හැකි නම් අපට කියන්න

- ඉරිදා දිනවල පස්වරුවේ බත්තරමුල්ල සිට පුරහල මහාබෝධි විදුහල දක්වා ප්ලාස්ටික් පුටු ප්‍රවාහනය සඳහා කුඩා ලොරියක් (ඩීමෝ බට්ටෙක් ප්‍රමාණවත් ය.) සහනදායී පදනමකින් සපයාගත යුතු ව තිබේ. ආරංචියක් වෙතොත් අපට කියන්න.
- 8′ × 10′ × 20′ කන්ටේනර් පෙට්ටියක් කාගෙන් හෝ පරිත්‍යාගයක් වශයෙන් ලබාගත හැකි නම් (දැනට තාවකාලිකව හෝ) සංගම් මූලස්ථාන ඉඩමේ "ඉදිකිරීම් කාර්යාලයක්" සඳහා ඉන් ඉමහත් ප්‍රයෝජනයක් ඇත. එවැන්නක් සපයා දීමට යම් හැකියාවක් වෙතොත් දැනුම් දීම ලොකු උදව්වක්.
- පරිත්‍යාගශීලියෙකු වෙතින් හෝ ප්‍රාදේශීය දේශපාලනඥයෙකු වෙතින් සංගමයේ පංතිවල හා අනිකුත් කටයුතුවල දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ප්ලාස්ටික් පුටු 100ක් සහ රෙදි කුඩාරමක් (10′ × 10′ හෝ 10′ × 20′) සපයා දිය හැකි නම් එය සංගමය වෙත කෙරෙන මහත් උපකාරයකි. ඒ සඳහා කිසියම් සම්බන්ධීකරණයක් සකස් කර දීමට ඔබට හැකි නම් කරුණාකර දැනුම් දෙන්න.
- සංගමයේ ඉරුදින ඡායාරූප පංති සඳහා භාවිත කරන පරිගණක උපකරණ හා මල්ටිමීඩියා යන්ත්‍ර දිනපතා රැගෙන ඒම සහ රැගෙන යාම ඒවායේ ආරක්ෂාවට ද පැවැත්මට ද හානිදායක වී ඇත. ඒ නිසා ඒවා සුරක්ෂිත ව ගබඩා කර තැබිය හැකි සහ අගුළු දැමිය හැකි වානේ අල්මාරියක් (අලුත් ම එකක් විය යුතු නැත.) සංගමයට පරිත්‍යාග කළ හැකි නම් ඉන් මහත් ප්‍රයෝජනයක් සැලසේ. එබඳු උපකාරයක් කරන්නට පුළුවන්කමක් තිබේ නම් අප අමතන්න.

උදිත 0718106680 තුෂාර 0714894848

**ඔන්න, කරනවා නම් වැඩ....**

---

# *සිංහල අවුරුදු උත්සවය සහ සුහද හමුව අප්‍රේල් 24 වන දා*

*ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සමාජ සේවා අංශය විසින් සංවිධානය කරනු ලබන සිංහල අවුරුදු උළෙලට සමගාමීව පවත්වනු ලබන සුහද හමුව 2016 අප්‍රේල් මස 24 වන ඉරු දින උදේ 8.00 සිට සවස 5.00 දක්වා කොළඹ 05, තිඹිරිගස්යාය, හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනයේ දී පැවැත්වේ. සාමාජික සාමාජිකාවන් සහ ඔවුන්ගේ පවුල්වල සැමට දැන හඳුනාගැනීමට සහ එක්ව සතුටු වීමට යොදාගෙන ඇති මෙම අවස්ථාව පැහැර නොහරින ලෙසට සමාජ සේවා අංශය සුහද සිතින් හා ගෞරවයෙන් ඔබ වෙත ඇරයුම් කර සිටී.*

*අවුරුදු උත්සවයට සමගාමීව සංගමයේ ඡායාරූප ශිල්පීන් සඳහා ම සංවිධානය කරන ක්‍රීඩා රසක් පැවැත්වේ. ප්‍රධාන වශයෙන් කරාතේ ක්‍රීඩා සංදර්ශනයක් ඇතුළත්ව ඇති අතර වේගය සහ රිද්මය තේමාව යටතේ ඡායාරූප ගැනීමට මෙය සංවිධානය කර ඇත. ගන්නා ඡායාරූප ඇතුළත් ප්‍රදර්ශනයක් හා තරගයක් ද, පැවැත්වීමට අධ්‍යක්ෂ (සමාජ සේවා) සහ සංවිධායක කමිටුව තීරණය කර ඇත. මේ සඳහා 12″×10″ හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයේ කලු සුදු හෝ වර්ණ ඡායාරූප ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. මෙහි දී පළමුවන, දෙවන සහ තෙවන ස්ථාන සඳහා ත්‍යාගයන් ද, කුසලතා සහතික 10 ක් ද, ලබාදීමට සැලසුම් කර තිබේ. තව ද ෆොටෝජෙනික් කුමරා සහ කුමරිය වශයෙන් තෝරාගන්නා දෙදෙනාට අමතර ව ඒ අය ඡායාරූපගත කළ ශිල්පීන් හට ද ත්‍යාග පිරිනැමීමට අදහස් කර ඇත. ෆොටෝජෙනික් කුමරා සහ කුමරිය සඳහා වයස් හෝ විවාහ අවිවාහක සීමාවක් නැත. සංගමයේ සාමාජිකත්වය පවත්වාගෙන යාම ඊට ප්‍රමාණවත් වේ. ඊට අමතර ව හාස්‍යෝත්පාදක විකට ඇඳුම් තරගයක් ද පැවැත්වේ.*

*කුඩා දරුවන් සඳහා වන විවිධ තරග පැවැත්වෙන අතර, වැඩිහිටියන් සඳහා කඹ ඇදීම කාන්තා / පිරිමි, ඉදිකටුවට නූල දැමීම, බෝතලයට වතුර පිරවීම, දෙදෙනෙකුගේ කකුල් බැඳ දිවීම, ආදී විවිධ ක්‍රියාකාරකම් සූදානම් කර ඇත. දිනන සැමට ත්‍යාග ලබාදීමට අපේක්ෂා කෙරේ. ඊට අමතර ව සංගීත පුටු තරගයක් ද පැවැත්වේ.*

*පැමිණෙන ලොකු, කුඩා සියලු දෙනා හට නැරඹීමට මැජික් සංදර්ශනයක් සංවිධානය කර ඇත. දවස පුරා ම නොයෙකුත් අංග පැවැත්වේ. උදෑසන ආහාරය, දිවා ආහාරය, සවස තේ සැපයීම ද, සමාජ සේවා කමිටුව විසින් සිදු කෙරේ. එක් අයකුගේ බරපැන ආහාර පාන සඳහා රුපියල් 750/= ක් පමණි. එම ඇරයුම් පතෙහි අංකයට දිනුම් ඇදීමක් කරනු ලබන අතර ඊට වටිනා ත්‍යාගයක් පිරිනැමේ.*

*මෙය සාර්ථක කරගැනීම සඳහා වඩාත් අවශ්‍ය වන්නේ ඔබගේ හෘදයංගම කැපවීම සහ සහභාගීත්වය යි. අපේ මහගෙදර: ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයට පැමිණ අවුරුදු අසිරිය විඳගෙන එළඹෙන අලුත් අවුරුද්ද මහ ගෙදර සියලු දූ පුතුන් ඥාතීන් සමග සතුටින් ගතකිරීමට ලෙන්ගතු සිතින් ඇරයුම් කරමු.*

***අවශ්‍ය ඇරයුම් පත් සහ වැඩි විස්තර සඳහා නොපමාව පහත සඳහන් සංවිධායක කමිටුව අමතන්න.***

*අධ්‍යක්ෂ සමාජ සේවා සහ සුබසාධන*

| | |
|---|---|
| *අනුර රාජා සිංහබාහු* | *දුරකථන අංක 077 3734786, 071 8592308* |
| *ශ්‍යාමලී කරුණාපාල* | *දුරකථන අංක 071 5184954* |
| *ප්‍රියන්ත අබේසුන්දර* | *දුරකථන අංක 077 7416669* |
| *නන්දනී හෙට්ටිආරච්චි* | *දුරකථන අංක 077 6840586* |
| *චන්දු ගුණවර්ධන* | *දුරකථන අංක 077 8485183, 071 6529423* |

**ඔබ එන්න....**
**ඇවිත් යන්න එන්න...**

# හඳුනාගත්තොත් ඔබ මා...

## සනත් සෝමසිරි බාලසූරිය - සෞන්දර්යය සොයා ගිය දුම්රිය සේවකයා...



ලොකුබාලසූරියගේ සනත් සෝමසිරි බාලසූරිය උපත ලැබුවේ 1942 අගෝස්තු 3 වැනිදා නිට්ටඹුවේ වේබඩගල්ලේ දී ය. ඒ ලොකුබාලසූරියගේ ජෝන් බාලසූරිය හා රන්දුනු පතිරන්නැහැලාගේ ඇලිස් රන්දුනු යුවළට දාව පිරිමි දරුවන් හයකගෙන් යුතු පවුලක තෙවැනියා ලෙස ය.

ඔහුගේ පියා වීදියවත්ත බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ (අද සෙනරත් විද්‍යාලය) හෙඩ් මාස්ටර් ය. එම පාසලේ ම ගුරුවරියක වූ තම මව සමඟ පාසැල් යමින් අධ්‍යාපන ජීවිතය ඇරඹූ ඔහු පසුව මිනුවන්ගොඩ නාලන්දා විද්‍යාලයෙන් ද, අවසානයේ වේයන්ගොඩ ශාන්ත මරියා විද්‍යාලයෙන් අ.පො.ස (සා/පෙළ) ඉහළින් සමත් වෙමින් අ.පො.ස (උ/පෙළ) සාර්ථකව සම්පූර්ණ කරමින් තම පාසල් අධ්‍යාපනය හමාර කළේ ය.

තම වැඩිමහල් සොහොයුරා සතු 'පෙට්ටි කැමරාව' පිළිබඳ කුතුහලයෙන් ඡායාරූපකරණය ගැන උනන්දු වන ඔහු දිවංගත විල්සන් හැගොඩ සූරීන් විසින් පවත්වනු ලැබූ ඡායාරූපකරණ පංතිවලට ඇතුළු වනුයේ අ.පො.ස (උ/පෙළ) සිසුවෙකු ලෙස සිටියදී ය. ඒ අංක 163 යටතේ 'කැමරා ළමා සමාජය'ට බැඳීමෙනි. අනතුරුව ඔහු ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අංක 242 යටතේ සාමාජිකත්වය ලබාගත් අතර ඔහුගේ 'යාවජීව' සාමාජික අංකය 7 වෙයි. 'කැමරා ළමා සමාජයේ' ඔහුගේ පංති සමකාලීනයන් වනුයේ ලාල් හැගොඩ, ජී. හෙට්ටිආරච්චි, තිලක් වෙරළුපිටිය වැනි ජ්‍යෙෂ්ඨ ඡායාරූප ශිල්පීන් ය.

පාසල් අධ්‍යාපනයෙන් පසු ටික කලක් ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඔහු 'මධ්‍යම ලිපිකාර සේවා' විභාගය සමත් වෙමින් 1966 දී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණකාධිකරණ අංශයේ ලිපිකරුවෙකු ලෙස සේවයට බැඳුණේ ය. එහෙත් සාම්ප්‍රදායික රාජ්‍ය සේවය ඔහුට එතරම් රැකියාමය තෘප්තියක් ගෙන නොආවේ ය. ඔහු නිමග්න වීමට බලාපොරොත්තු වූ රැකියාමය ක්ෂේත්‍රය එය නොවීම ද ඊට එක් හේතුවක් විය. එනිසා ම ඔහු ඡායාරූපකරණ ක්ෂේත්‍රයට යැමේ බලාපොරොත්තුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව හරහා ම අයදුම් කර රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයෙන් (හේවුඩ් විද්‍යායතනය) ඡායාරූප ශිල්පය පිළිබඳ දෑ අවුරුදු පාඨමාලාවක් හැදෑරීය. එවක එකී විද්‍යාලයේ 'ඡායාරූප අංශය' බී. පී. වීරවර්ධනයන් යටතේ පැවති අතර බාලසූරිය මහතා 1971 වර්ෂයේ පැවති එකී පාඨමාලාවේ අවසන් විභාගයෙන් පළමුවැනි පෙළ සාමාර්ථ්‍යයක් ලත් එක ම පුද්ගලයා විය. මෙසේ රැකියාවේ නිරත වන අතරතුර හැට දශකයේ අග භාගයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ බාහිර කලා උපාධියක් හදාරන්නට ද ඉදිරිපත් විය. තව ද ඔහු ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අවුරුදු ඩිප්ලෝමාව 1973 වර්ෂයේ දී ලබා ගත්තේ ය. 1975 අප්‍රේල් 10 වැනි දින ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය විසින් බාලසූරිය මහතාට සම්මාන ආශ්‍රිත සාමාජිකත්වය (*Honorary Associateship*) ද ඉන් පසුව ගරු සහාගී සාමාජිකත්වය (*Honorary Fellowship*) ද පිරිනැමීය.

මෙසේ දුම්රිය දෙපාර්තමේන්තු සේවයේ නිරත වන අතරතුර 1980 ජූලි වර්ජනයට සහභාගි වීමේ එක් ප්‍රතිඵලයක් වූයේ ඔහුට රාජ්‍ය සේවයෙන් සමුගෙන ඡායාරූපකරණ ක්ෂේත්‍රයට පිවිසීමට මග පෑදීමයි.

ඉන් අනතුරුව බාලසූරිය මහතා දිවුලපිටියේ 'සාගර ෆොටෝ' ස්ටූඩියෝව ආරම්භ කරන්නේ ය. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාලයේ දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පුද්ගල ඡායාරූප ගැනීමේ කටයුතුවලට ගම්පහ දිස්ත්‍රික්කයෙන් වඩාත් ම සුදුසුකම් ඇති පුද්ගලයා ලෙස තෝරාගෙන තිබුණේ බාලසූරිය මහතාව ය. මේ වන විට ඔහු රාජ්‍ය සේවය හැර ගොස් තිබූ බැවින් එකී දෙපාර්තමේන්තු අනුමැතිය ද සමග පුද්ගලයින් ලියාපදිංචි කිරීම සඳහා ඡායාරූප ගැනීමේ කටයුත්ත ද ආරම්භ කළේ ය.

ඉන්පසු අසූව දශකයේ අග රටේ පැවති දේශපාලන භීෂණ සමයේ ව්‍යාපාරයට ඇති වූ ප්‍රශ්න නිසා ද තම මවගේ අසනීප තත්ත්වය හේතුවෙන් ඇයට උපස්ථාන කිරීමට ඔහුගේ කාලය යොදවන ලදී. 1992 දී මවගේ වියෝවින් පසු නැවතත් ඔහු උඩුගම්පල ස්ටූඩියෝවක් ආරම්භ කළේ ය. එම කාලයේ දී ම ඔහු ගම්පහ දිස්ත්‍රික්කයේ 'ෆූජි සේයා පටල' බෙදාහැරීමේ නියෝජිතයා ලෙස කටයුතු කරමින් ආර්ථික වශයෙන් සාර්ථක ගමනක යෙදුනේ ය. අනතුරුව එකී සේයා පටල සැපයූ ආයතනයේ කඩාවැටීම හා එනිසා ම පැමිණි ප්‍රශ්න මත 1996 දී එකී නියෝජිතත්වය ඔහු අත්හැරියේ ය.

ඉන්පසු දිවුලපිටියේ වටරවුම් පාරෙන් ඉඩමක් මිල දී ගෙන ගොඩනැගිල්ලක් තනන ඔහු 2000 වර්ෂයේ දී 'සුපිරි සම්පත් ස්ටූඩියෝ' නමින් තම ඡායාරූප ශිල්ප ව්‍යාපාරය ආරම්භ කළේ ය. එකල ලංකාවට ඩිජිටල් කැමරාවල ආගමනයත් සමඟ *NIKON D-70* කැමරාවක් මිල දී ගන්නා ඔහු බස්නාහිර පළාතේ ඩිජිටල් ඡායාරූපකරණ සේවාවන් ආරම්භ කළ ප්‍රමුඛයකු වන්නේ ය. මෙම නවීන සේවාව පාරිභෝගිකයන්ගේ ආකර්ශනය වැඩි කිරීමට හේතු වන අතර එහි ප්‍රතිඵලය වන්නේ ඔහුගේ ව්‍යාපාරය සාර්ථක වීම ය. අද පවා ඔහුගේ පැරණි පාරිභෝගිකයින් දුර බැහැර සිට තම ඡායාරූපකරණ අවශ්‍යතා සඳහා තම ස්ටූඩියෝව වෙත පැමිණෙන බව ඔහු පැවසුවේ ඉමහත් තෘප්තියෙනි.

බාලසූරිය මහතා ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ විවිධ නිලතල දරමින් ක්‍රියාශීලීව කැපවෙමින් සංගමයේ අභිවෘද්ධිය සඳහා සේවාවන් රැසක් ඉටු කළේ ය. 1994/1995 වර්ෂයේ සංගමයේ මුදල් අධ්‍යක්ෂක ලෙස ක්‍රියා කළ අතර 2006/2007 හා 2013/2014 යන වර්ෂවල දී සංගමයේ ලේඛකාධිකාරී ධූරය දරන ලදී. 2012/2013 වර්ෂයේ දී සංගමයේ ප්‍රකාශන අධ්‍යක්ෂ ලෙස ක්‍රියා කළේ ද බාලසූරිය මහතා ය.

ඔහුගේ කටයුතු සේවාවන්ට පමණක් සීමා නොවිණි. ඔහු සංගමයේ අභිවෘද්ධියට අවශ්‍ය අවස්ථාවල දී නොමසුරු මූල්‍යමය හා අනෙකුත් දායකත්වයන් දක් වූයේ ය. ඉන් කිහිපයක් හෝ සටහන් කිරීම ඔහුට සංගමයේ කෘතවේදීත්වය දක්වීමකි. ඔහු ෆූජි සේයා පටල බෙදාහැරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කළ කාලයේ දී සංගමයේ 'මාසික තරඟ ජයග්‍රාහකයන් සඳහා සේයා පටල තෑගි දුන්නේ ය. තවද ශිෂ්‍යයන්ට ඉගැන්වීමේ කටයුතු සඳහා අතේ ගෙන යා හැකි 'එන්ලාජරයක්' (*Portable Enlarger*) සංගමයට පරිත්‍යාග කළේ ය. තව ද ඡායාරූප සංගමයේ ප්‍රකාශනය 'ලංකා කැමරා' ලෙස නැවත මුද්‍රණය කිරීමට මුල් වූවන්ගෙන් කෙනෙකු වෙමින් ද ආර්ථික අවිනිශ්චිතතාවන් නොතකා ඊට තම මුදල් ආයෝජනය කිරීම මේ සඳහා වන තවත් ප්‍රශංසා කටයුතු උදාහරණයකි.

1996 දී සාගරිකා බාලසූරිය වන ඔහුගේ බිරිඳ වියෝ විය. එහෙත් ඔහු තම පිරිමි දරුවන් තිදෙනා ද, ඡායාරූපකරණ ව්‍යාපාරය ද සමග සැනසුමෙන් තෘප්තිමත් ව ජීවන මගෙහි ගමන් කරමින් සිටින්නේ ය. ඔහුගේ කැපී පෙනෙන ම ලක්ෂණය වන්නේ ඡායාරූප සංගමය ද ඔහුගේ ජීවිතයේ අනිවාර්ය කොටසක් වීමයි. ගතින් වියපත් වුව ද, අතීතයේ දී මෙන් ම අද ද ඔහු සංගමයේ කටයුතුවලට සක්‍රිය ව සම්බන්ධ වෙයි. සංගමයේ අනාගත කටයුතු ගැන සිතයි. ඊට විවිධ අයුරින් දායක වෙයි. මෙම සොඳුරු මිනිසා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 'යාවජීව' සාමාජිකයෙකු බව කිව යුතු ය.

*අරුලාවල*

---

### අපේ ශෝකය



- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික අශෝක ජේමසිරි මහතාගේ දයාබර මාමණ්ඩිය හදිසියේ අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.
- ජ්‍යෙෂ්ඨ සාමාජිකා රංජනී අරන්දර මහත්මියගේ දෙටු සොහොයුරිය අභාවප්‍රාප්ත විය. සාමාජික සියලු දෙනාගේ සාතිශය සංවේගය අරන්දර පවුල වෙත පිරිනමමු.
- සංගමයේ යාවජීව සාමාජික, සම්මානනීය සිනමාවේදී කේ. ඒ. විජයරත්න මහතා හදිසියේ අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සියලු සාංගමිකයන්ගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමු.
- නවක සාමාජිකා දමයන්ති කුමාරි ගමගේගේ (16/7033) දයාබර මාමණ්ඩිය හදිසියේ අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරමු.

---

## ගොඩනැගිලි අරමුදලට ඔබේ දායකත්වය



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම ක්‍රම තුනට යටත්ව රු. 12000/=ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු. මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමිය වෙත මුදලින් ලබා දිය හැකි ය.

<u>ගෙවීම් ක්‍රම විධි</u>

1. එකවර රු. 12000/= ක මුදල පරිත්‍යාග කිරීම.
2. 2016 දෙසැම්බර් 31 දිනට පෙර රු.6000/= ක මුදලක් සහ 2017 දෙසැ 31ට පෙර ඉතිරි රු. 6000/= ක මුදල පරිත්‍යාග කිරීම.
3. මසකට රු. 1000/= බැගින් මාස 12ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම.

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු. 12000/= මුදල ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශිර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. මුදල් පරිත්‍යාග කරනු ලබන අනුපිළිවෙළ අනුව මූලස්ථාන ස්වර්ග මුද්‍රිකාලාභීන්ගේ නාමලේඛනය මීළඟ පිළිසඳර කලාපයේ පටන් පළ කෙරේ.

සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශිර්වාද කරන බාහිර පරිත්‍යාගශීලි හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සාමාජිකයෙකු නුවූවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සහෘද සුයාමය

**සොම්නස ද ළබැඳියාව ද සමගින්**

**අප්‍රේල් 24 අපි හමුවෙමු !**

**පෙ.ව. 8.00 ට**

**තිඹිරිගස්යාය**
**හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනයේ දී**

**ඇරයුම**
- ඔබටත්
- පවුලේ ඇත්තන්ටත්
- ආවොත් පෑහෙයි කියා සිතන ඔබේ හිතමිතුරන්ටත්

**සත්කාරය**
- උදේ ආහාරය
- තේ පැන් සංග්‍රහය
- දිවා ආහාරය
- සවස තේ පැන් සංග්‍රහය

**කුඩා දරුවන්ට අවුරුදු ක්‍රීඩා ඉසව්, සාමාජික සැමට අවුරුදු ක්‍රීඩා හා වෙනත් විශේෂාංග...**
**සැමට තිළිණ !**

**පැමිණීම** නොවරදවා ම උදේ අටට ! ඇයි දන්නවද ?
උදේ ම එකට එකතුවෙලා කිරිබත් කෑල්ලක් කන්න ඕන නිසා...

**බරපැන** ආහාර පාන සඳහා පමණයි.
ඉතිරි වියපැහැදම් සපයාගන්නට සමාජ සේවා සහ සුබසාධන කමිටුවේ අය මේ දවස්වල බොහොම වෙහෙසෙනවා.

**වෙලාවට වැඩ** අපි කළ යුතු වෙලාවට වැඩ කරන්න පුරුදුවෙමු. අප්‍රේල් 10 දිනට පෙර පැමිණීම තහවුරු කරන ඔබට ආහාරපානවලට යන මුදලිනුත් 25% ක අඩුවක්. ඒ තමා මේ වතාවෙ Early Bird Discount.

**සංවිධාන කාර්යය** සමාජ සේවා සහ සුබසාධන කාර්යයන්ට කැපවී සිටින අපේ සහෝදර පිරිස.

**ඔබේ වගකීම** සියලු ම කෑම බීම අනිකුත් කළමනා ඇතුළු ඔබ සඳහා වන පහසුකම් පිටතින් රැගෙන ආ යුතු නිසා ඔබේ පැමිණීම වහාම තහවුරු කරගත යුතුව තිබෙනවා. නොදන්වා හදිසියේ කඩාපාත් වුනොත් කලින් දන්වා එන අයත්, සංවිධායක කමිටුවත්, ඔබත් ලොකු අකරතැබ්බයකට මුහුණපානවා. ඒ නිසා **අප්‍රේල් 10 ට පෙර** ඔබ සහ ඔබ සමග එන පිරිස, සිංහබාහුට (077 3734786), ශ්‍යාමලීට (071 5184954), තුෂාරට (071 4894848) හෝ උදිතට (071 8106680) දැනුම් දී අවසරපත කල් තබා වෙන්කොට ගැනීම ඔබේ වගකීමක් !

**ඔබේ යුතුකම** කාලෙකට පස්සෙ,
හොඳ හිතින් සතුටින් ඔබ වෙනුවෙන් කරන මේ ආරාධනය පිළිගෙන අප්‍රේල් 24 දා එන එක ඔබේ යුතුකමක් !

# ඔබ එනතුරු අපි මග බලාගෙන !

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධනය සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු උපදෙස්.

**මාතෘකාව තෝරාගැනීම සහ සංස්කරණය**

- සියලු ම නිබන්ධන සම්පාදකයින් අදාළ නිබන්ධන මාතෘකාව තෝරාගැනීම, සුදුසු ආකාරයට සංශෝධනය කිරීම සහ නිබන්ධනයේ ප්‍රධාන අංශ මෙන් ම අනු අංශ පිළිබඳ අවසන් තීරණ ගැනීම සම්බන්ධයෙන් නිබන්ධන උපදේශකවරයාගේ උපදෙස් පිළිපැදිය යුතු වන අතර අවසන් වශයෙන් තීරණය වූ මාතෘකාව ලිඛිතව සංගමය වෙත භාර දිය යුතු වේ. නිබන්ධන සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් ගරු ලේඛකාධිකාරීවරයා වෙතින් අදාළ ආකෘති පත්‍රය ලබාගෙන නිසි පරිදි පුරවා නියමිත දිනට සිය පංති භාර ආචාර්යවරයා හෝ නිබන්ධන කටයුතු භාර ආචාර්යවරයා වෙත භාරදිය යුතු ය.
- එකී නිබන්ධන යෝජනාව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන කමිටුවකින් සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කිරීමෙන් පසු නියමිත අධ්‍යයන කාර්යයට අවසරය ලැබෙනු ඇත.
- සියලු ම නිබන්ධන සම්පාදකයින් ආරම්භයේ පටන් නිබන්ධනය අවසානය වන තෙක් නිබන්ධන උපදේශකවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

**නිබන්ධනය වශයෙන් තෝරාගත හැකි ඉදිරිපත් කිරීම්**

- ඡායාරූපකරණයට හෝ පොදුවේ ප්‍රතිබිම්බ මූලික කලාවන්ට, එනම් රූපවාහිනී තාක්ෂණයට, වීඩියෝකරණයට, සිනමාවට අදාළත්වයක් ඇතැයි පිළිගත හැකි තෝරාගනු ලබන මාතෘකාවක් මත පර්යේෂණාත්මක හෝ ගවේෂණාත්මක ලිඛිත නිබන්ධනයක්. නිබන්ධනය වචන 4000 කට නොඅඩු හා වචන 7000 ක් නොඉක්මවන්නක් විය යුතු ය. (තෝරාගන්නා ලද විෂය හා මාතෘකාව මත හෝ නිබන්ධන උපදේශකවරයාගේ නිර්දේශයට යටත් ව ඉහත සීමාව වෙනස් වන්නට පුළුවන). ලිඛිත නිබන්ධනයේ පිටු සැකැසුම මෙම චක්‍රලේඛයේ මුල් පිටපතෙහි දැක්වෙන උපදෙස් පරිදි සිදුකළ යුතු ය.
- විනාඩි 20 ක උපරිම කාල සීමාවකට යටත් ව වෘත්තාන්තමය හෝ වාර්තාමය වීඩියෝ නිෂ්පාදනයක්.
- සංගමයේ ඡායාරූප පාඨමාලා විෂය නිර්දේශයෙහි පාඩම් මාතෘකාවකට අනුව සම්පාදනය කරන ලද ඉගෙනුම් ආධාරක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහනක්. (Audio Visual Multimedia Presentation) මෙහි කාල සීමාව විනාඩි 20 සිට 60 අතර දක්වා විය හැකි ය.
- ඉහත සඳහන් කිසියම් එක් ආකාරයකට සකසන ලද නිබන්ධනය නියමිත දිනට හෝ ඊට ප්‍රථම පිටපත් දෙකකින් ලේඛකාධිකාරී (විභාග) වෙත භාර දිය යුතු ය.

සෑම අපේක්ෂකයකු විසින් ම තමා ඉදිරිපත් කරන ලද නිබන්ධනය පිළිබඳව වාචික කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකළ යුතු අතර එහි දී උචිත ඉදිරිපත් කිරීමේ උපක්‍රම හා උපාංග භාවිත කළ යුතු ය. මේ සියලු ඉදිරිපත් කිරීම් ඩිප්ලෝමා පරීක්ෂණය සඳහා ම සම්පාදනය කරන ලද ඒවා විය යුතු ය.

**ඩිප්ලෝමා පරීක්ෂණයට අදාළ නිබන්ධනය පිළිබඳ (වාචික) ඉදිරිපත් කිරීම**

**(කාලය විනාඩි 15)**

**ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ**

- පරීක්ෂක මණ්ඩලය ඉදිරියට පැමිණීම (තත්. 20)
- ආශිංසනය හා ආමන්ත්‍රණය (තත්. 10)
- ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම (විනාඩි 1)
- අරමුණ පැහැදිලි කිරීම සහ විෂය පරාසය පැහැදිලි කිරීම (විනාඩි 1)
- අදාළ විෂය කරුණු එකින් එක ඉදිරිපත් කිරීම (විනාඩි 8)
- ඉදිරිපත් කළ කරුණු සාරාංශ කර දැක්වීම (විනාඩි 1)
- ගැටලු ඉදිරිපත් කිරීමට ආරාධනා කිරීම } (විනාඩි 3)
- ගැටලු සඳහා පිළිතුරු සැපයීම }
- නිම කිරීම සහ ස්තුති කිරීම. (තත්. 30)

**සැලකිය යුතු කරුණු**

- සිටගැනීම (ඉදිරිපත් කිරීම සිදුකරන කාලය තුළ නිවැරදි ඉරියව් පැවැත්වීම)
- සෑම විට ම පරීක්ෂක මණ්ඩලය දෙසට මුහුණලා සිටීම සහ ඇස් යොමු කිරීම
- ශබ්ද නගා කතාකිරීම
- දෑත් පරිහරණය හා අදහස් ප්‍රකාශනය
- සුදුසු පරිදි ඉදිරිපත් කිරීමේ නිදර්ශන, ආකෘති, උපාංග සහ උපකරණ භාවිතය. (Examples, Miniatures, Slides/ Transparencies, Show Cards, Video, Multi Media)
- ගැටලු සඳහා පිළිතුරු සැපයීමේ දී අදාළ විමසුමට ම ඉලක්කගතව තාර්කික පිළිතුරු ඉදිරිපත් කිරීම.

# 2016 මාර්තු මාසික ඡායාරූප තරගය

2016 වසරේ සංගමය විසින් පවත්වන ලද මාර්තු මසට නියමිත 'මාසික ඡායාරූප තරගය' සඳහා ඉදිරිපත් කර ජයග්‍රහණය කරන ලද ඡායාරූප ශිල්ප විද්‍යාර්ථීන් සහ ඡායාරූප කිහිපයක් මෙහි දැක්වේ.

**පළමු වසර**

**කලු සුදු**

01. මොහාන් ගුරුසිංහ
02. ඩී.ජී.ටී. ගිහාන්
03. සුධාකර මොල්ලිගොඩ
03. ලක්ෂාන් මාපා

**වර්ණ**

01. සුධාකර මොල්ලිගොඩ
02. ගගන් කරුණාචන්ද්‍ර
03. ජී. ඩී. එස්. සඳරුවන් කුමාර



**Not ready to accomplish**
සුධාකර මොල්ලිගොඩ



**One step ahead**
කසුන් රණමුක

**දෙවන වසර**

**කලු සුදු**

01. කසුන් රණමුක
02. කසුන් රණමුක
03. එම්. බී. ජී. රංගන
03. වයි. වී. ඒ. කුෂාන් විමුක්ති

**වර්ණ**

01. තේරී නොමැත
02. තාරක ගුණරත්න
03. දිනේෂ් ජයවර්ධන
03. කසුන් රණමුක

**තෙවන වසර**

**කලු සුදු**

තේරී නොමැත

**වර්ණ**

01. තේරී නොමැත
02. ධනුෂ්ක ජීවන්දර
02. සුරේෂ් එස්. වීරසිංහ
03. සුරේෂ් එස්. වීරසිංහ

**සමස්ත තරග ප්‍රතිඵල**

**කලු සුදු**

01. කසුන් රණමුක
02. මොහාන් ගුරුසිංහ
03. ඩී. ජී. ටී. ගිහාන්
04. කසුන් රණමුක
05. එම්. බී. ජී. රංගන

**වර්ණ**

01. සුධාකර මොල්ලිගොඩ
02. ධනුෂ්ක ජීවන්දර
03. ගගන් කරුණාචන්ද්‍ර
04. සුරේෂ් එස්. වීරසිංහ
05. ජී. ඩී. එස් සඳරුවන් කුමාර

---

**නිරෝගී සුව පතමු**

අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු සේ ම හලාවත තෙවන ඇස ඡායාරූප හා මාධ්‍යවේදීන්ගේ සංගමයේ නිර්මාතෘවරයා ද වන පර්සි ප්‍රනාන්දු මහතා බලවත් සේ රෝගාතුර වී සිටී. ඒ මහතාට ඉක්මන් නිරෝගී සුව ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

සංගමයේ සියලු දෙනාගේ සොම්නස එකට කැටිවන

**සුහද හමුව හා අවුරුදු සාමීචිය**

**අපේ දවස**
**අප්‍රේල් 24**

ඔබ එන්න !
ඔබ එන්න ම ඕනෑ !!

**උදෑසන 8.00** තිඹිරිගස්යාය
**හෙන්රි පේදිස් ක්‍රීඩාංගනය**

**පොඩි එකෙකුට PHOTO එකකට ඉන්න කිව්වම**




### *අභිමි සෙනෙහස*

*දුල්වෙයි පහන් සිල හදවත දවාලන*
*කම්මුල් රත් දෙතොල් සුදුමැලි වී පාට*
*ලය මත දෑත් බැඳ නෙත් යුග වසා ගෙන*
*ඇයි සොඳුරියෙ ගියේ මා හට නොකියාම*

*මැදිකර නුඹව පැදකුනුකර සියලු දෙන*
*මිටින් පස් දමයි ගරු කර සමුගන්න*
*බොල් හඬ මුසුව ඇසෙනට නුඹෙ ඉකි බිඳුම*
*බැඳි ලෙන්ගතුව සිත වාවනු බැහැ නේද*

*කවුරුත් නොමැති සීතල සනඳුරු රැක*
*නුඹෙ සිත සනසන්න ළඟ ඉන්නේ කවුද*
*සිතුවිලි මතක ඇවිදින හිස් නිවස තුළ*
*විනිවිද අඳුර හද සනසයි නුඹගෙ රුව*

*ලාල් වික්‍රමතන්ත්‍රී*


පිළිසඳරට **වෙහෙස මහන්සිය**

ප්‍රකාශන අධ්‍යක්ෂ ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ මහතා

පිළිසඳර - ප්‍රකාශන අනු කමිටුව

1 වසර - මින්දුරි අබේසේකර මෙය
චමින්ද වීරසිංහ මහතා

2 වසර - මදුෂිකා ලක්මාලි මෙය
ආර්. එම්. මඩවල මහතා

3 වසර - චින්තක දන්තනාරායන මහතා